14716

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2018

## 06 - ශ්‍රේණිය


## ගණිතය

නම/විභාග අංකය :- ...................................................... කාලය: පැය 02 යි.

I කොටස

- පළමු ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න සියල්ලටමත් II ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 5කටත් පිළිතුරු සපයන්න.

(01) මෙහි වෘත්ත කීයක් තිබේ ද?



(02) 62532841 සංඛ්‍යාව වචනයෙන් ලියන්න.

(03) සංඛ්‍යා රේඛාවක් ඇඳ -2 හා 5 ලකුණු කරන්න.

(04) සුළු කරන්න.

(a)
$$\begin{array}{r} 124 \\ +\ 295 \\ \hline \\ \hline \end{array}$$

(b)
$$\begin{array}{r} 191 \\ -\ 77 \\ \hline \\ \hline \end{array}$$

(c) 625 - 12 = ....................

(d) 283 - 27 = ....................

(05) 19 සාධක 02ක ගුණිතයක් ලෙස දක්වන්න.


(06) විශාලතම ඒකක භාගය කුමක් ද?


(07) 0.24 + 1.37 සුළු කරන්න.

(08) 2.8kg ග්‍රෑම් වලින් දක්වන්න.

(09) 2018 අගෝස්තු 05 දින ප.ව. 9.02 සම්මත ආකාරයට දිනය හා වේලාව ලියා දක්වන්න.

(10) මෙහි එකිනෙකට වෙනස් මුහුණත් 02ක දළ සටහන් ඇඳ දක්වන්න. (මිනුම් සහිතව)





(11)  නිරූපනය වන අගය කීය ද?

(12) පහත වගන්ති නිවැරදි නම් ✓ ලකුණ ද වැරදි නම් × ද ඉදිරියේ ඇති කොටුව තුළ යොදන්න.

| | |
|---|---|
| සරල කොණයට සෘජුකෝණ 02ක් ඇත. | |
| මහා කෝණය හා පරාවර්ථ කෝණය සමාන කෝණ 02කි. | |
| සෘජු කෝණයට වඩා කුඩා කෝණ සුළු කෝණ වේ. | |


(13) $32 = 2^{\square}$ හිස් කොටුව සම්පූර්ණ කරන්න.

(14) 

මෙහි සෘජුකෝණාස්‍ර කීයද? ඒවා අඳුරු කර (පාට කර ) දක්වන්න.


(15) පැන් 714ක් සිසුන් 17 දෙනෙකු අතර බෙදා ගනු ලැබුවේ නම් එක් අයකුට ලැබෙන පැන් ගණන කීය ද?


(16) සුනිල්ගෙ බර 45kg ක්ද, නිමල්ගේ බර 70kg ද වේ. ඉහත තොරතුරු පහත සංඛ්‍යා රේඛාව මත ලකුණු කරන්න.




(17) පහත කරුණු සියල්ල සපුරාලන සංඛ්‍යාව කුමක් ද?
- මෙම සංඛ්‍යාව 50ට වඩා අඩුය. 10ට වැඩිය.
- සමචතුරස්‍ර සංඛ්‍යාවක් වේ.
- ත්‍රිකෝණ සංඛ්‍යාවක් වේ.

(18) 1000$l$ ජල ටැංකියකින් $\frac{1}{4}$ ක් ජලය පිරවීමට මිනිත්තු 30ක කාලයක් ගතවේ. ටැංකියෙන් $\frac{3}{4}$ ක් පිරවීමට ගතවන කාලය කොපමණ ද?

(19)  රූපයෙන් සිසුන් 8 දෙනෙකු නිරූපණය වන චිත්‍ර ප්‍රස්තාරයක ,

 මගින් නිරූපිත සිසුන් ගණන කොපමණ ද?

---

(20) 2.5 .......... 2.05 හිස්තැනට >, < ලකුණ යොදා සම්බන්ධ කරන්න.

---

## II කොටස

- **පළමු ප්‍රශ්ණය හා තවත් ප්‍රශ්න 04කට පිළිතුරු සපයන්න.**

---

(01) (i) 6285 යන සංඛ්‍යාවේ,

a. 8 නිරූපිත අගය කීය ද?

b. 8 හි ස්ථානීය අගය කීය ද?

c. 8 පිහිටි ස්ථානය කුමක් ද? (ලකුණු 03)

(ii) දෙබිලියන හතලිස් පස් මිලියන දෙසිය හතලිස් තුන් දහස් දෙක ඉලක්කමෙන් සම්මත ආකාරයට ලියන්න.

(ලකුණු 02)

(iii) 10හි ආකලන බන්ධන 03ක් ලියන්න. (ලකුණු 02)

(iv) පහත දැක්වෙන සංඛ්‍යා සුළු කිරීමෙන් තොරව ඉරට්ටේ ද ඔත්තේ ද යන්න සඳහන් කරන්න.

a. $242 + 125$

b. $308 - 44$

c. $28 \times 42$

d. $625 \div 5$ (ලකුණු 02)

(v) මුල් සමචතුරස්‍ර සංඛ්‍යා 05 ලියන්න. (ලකුණු 02)

(vi) 1 ප්‍රථමක සංඛ්‍යාවක් නොවන්නේ කුමක් නිසාදැයි හේතු සහිතව දක්වන්න. (ලකුණු 02)

(vii)  ................. මෙම සංඛ්‍යා රටාවේ ඊළඟ රටාව ඇඳ දක්වන්න. (ලකුණු 02)

(viii) ඉහත (vii) හි සංඛ්‍යා රටාව කුමන නමකින් හඳුන්වයි ද? (ලකුණු 01)

---

(02) (i) පහත සඳහන් භාග සංඛ්‍යා හිස්තැනට >, < ලකුණ යොදා සම්බන්ධ කරන්න.

a. $\frac{1}{8}$ ........ $\frac{1}{5}$ b. $\frac{2}{7}$ ........ $\frac{3}{7}$ c. $\frac{3}{4}$ ........ $\frac{1}{2}$ d. $\frac{2}{3}$ ........ $\frac{5}{6}$ (ලකුණු 04)

(ii) පහත භාග සංඛ්‍යා සුළු කරන්න.

a. $\frac{3}{8} + \frac{1}{2}$ b. $\frac{2}{12} - \frac{2}{3}$

(iii) පියෙක් තමා සතු ඉඩමෙන් $\frac{1}{2}$ බිරිඳට ද $\frac{1}{3}$ ක් පුතාට ද, ලබා දී ඉතිරිය තමා ළඟ තබා ගනී. වැඩිම කොටසක් ලැබුණේ කාටද? හේතු සහිතව දක්වන්න. (ලකුණු 04)

(03) (i) 2 : 3 අනුපාතයට තුල්‍ය අනුපාත 03ක් ලියන්න. (ලකුණු 02)

(ii) සනුප මූර්තියක් නිර්මාණය සඳහා සිමෙන්ති තාච්චි 06කට වැලි තාච්චි 02ක් මිශ්‍ර කරන ලදී,

a. ඉහත තොරතුරු අනුපාතයක් ලෙස ලියන්න. (ලකුණු 02)

b. එය සරලම ආකාරයෙන් දක්වන්න. (ලකුණු 03)

(iii) $3^3$ ප්‍රසාරණය කර ලියා අගය සොයන්න. (ලකුණු 03)

(iv) 256, 2හි බලයක් ලෙස ලියා දක්වන්න. (ලකුණු 03)


(04) (i) දිග, පළල, ගැඹුර, ඝනකම ආදිය දිගක් ලෙස සලකන බව ඔබ ඉගෙන ගෙන ඇත. මේවාට උදාහරණ 02 බැගින් ලියන්න. (ලකුණු 04)

(ii) 2m 20cm

a. cm වලින් ප්‍රකාශ කරන්න.


b. මීටර් වලින් ප්‍රකාශ කරන්න. (ලකුණු 02)

(iii) පහත රූපයේ පරිමිතිය සොයන්න.





(ලකුණු 02)

(iv) පහත දක්වෙන්නේ 1cm බැගින් වූ කොටු දැලකි. එහි අඳුරු කළ රූපයේ වර්ගඵලය $cm^2$ කීය ද? (ලකුණු 02)



(05) (i)




රූපයේ පෙන්නුම් කර ඇති අංකවලින් දක්වෙන කෝණය කුමන වර්ගයට අයත්දැයි අංක අනුව ලියා දක්වන්න.

1 . ..............................................

2 . ..............................................

3 . ..............................................

4 . ..............................................

5 . ..............................................

6 . ..............................................

7 . .............................................. (ලකුණු 07)

(ii) මුහුණත් 6 හා ශීර්ෂ 8ක් දාර 12ක් ඇති ඝන වස්තුව නම් කරන්න. (ලකුණු 01)

(iii) සමාන්තරාස්‍රයක් හා ත්‍රිපීසියමක හැඩයන් ඇඳ දක්වා ඒවායේ ලක්ෂණද ලියා දක්වන්න. (ලකුණු 03)

- - www.mathspapers.info - -

(06) (i) සතිරගේ බෑගයේ ඇති පොත් ප්‍රමාණය වීජීය සංකේතයක් මගින් දක්වන්න. (ලකුණු 02)

(ii) සතිරගේ බෑගයේ ඇති පොත් ප්‍රමාණයට වඩා පොත් පහක් වැඩියෙන් නිමාෂාගේ බෑගයේ ඇත. නිමාෂාගේ පොත් බෑගයේ ඇති පොත් ගණන සඳහා වීජීය ප්‍රකාශනයක් ගොඩ නගන්න. (ලකුණු 02)

(iii) සෙහස්ගේ බෑගයේ ඇත්තේ සතිරගේ බෑගයේ පොත් ගණනට වඩා පොත් 02ක් අඩුවෙනි. සෙහස්ගේ බෑගයේ ඇති පොත් ගණන වීජීය ප්‍රකාශනයකින් දක්වන්න. (ලකුණු 02)

(iv) $P = 12$ නම් පහත ප්‍රකාශනවල අගය සොයන්න.

a. $P+7$ (ලකුණු 01)

b. $P-7$ (ලකුණු 02)

c. $5+P$ (ලකුණු 02)

(07) 6 ශ්‍රේණියේ බටිති පන්තියේ සිසුන් පාසල් පැමිණෙන ආකාරය පහත දැක්වේ.

| පාසලට පැමිණෙන ක්‍රමය | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|
| බසයෙන් | 14 |
| පාසල් වෑන් රථවලින් | 12 |
| පාගමනින් | 08 |
| පුද්ගලික වාහන වලින් | 06 |
| පා පැදියෙන් | 05 |

(i) ඉහත තොරතුරු චිත්‍ර ප්‍රස්තාරයක දක්වන්න. (ලකුණු 05)

(ii) සිසුන් වැඩිම ප්‍රමාණයක් භාවිතා කරන ප්‍රවාහන ක්‍රමය කුමක් ද? (ලකුණු 02)

(iii) මුළු සිසුන් ගණන කොපමණ ද? (ලකුණු 01)

(iv) පාසල් වෑන් රථවලින් පැමිණෙන සිසුන් ගණන මුළු සිසුන් ගණනේ භාගයක් ලෙස දක්වන්න. (ලකුණු 03)



MATHS PAPERS.INFO
ඔබට අවශ්‍ය සියලුම ගණිත ප්‍රශ්න පත්‍ර ( mathspapers.info ) වෙතින් පහසුවෙන්ම ලබාගන්න